# දෙවන වාර පරීක්ෂණය - 2018

## ගණිතය

## 6 ශ්‍රේණිය

කාලය : පැය 2 යි.

නම :- ..........................................................................................................

### I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. දී ඇති වෘත්තය මත 'X' ලෙස ලක්ෂයක් ලකුණු කරන්න.



02. තුන් මිලියන එක් දහස ඉලක්කමෙන් ලියන්න.

03. 6025, ගණක රාමුවේ නිරූපණය කරන්න.



04. සුළු කරන්න. 221 + 422 + 15

05. ආරෝහණ පිළිවෙලට ලියන්න.
-1, 4, 0, -5, 2

06. 67 ට පසු ඇසු සංඛ්‍යා වලින් ආසන්න 10 වැටයු විට පිළිතුර 70 වේ. මෙ සඳහා ඔබට ගත හැකි සංඛ්‍යා ලියන්න.

07. නිවැරදි සම්බන්ධතාව යටින් ඉරක් අඳින්න.
   i. සුළු කෝණය > මහා කෝණය > පරාවර්ත කෝණය > සෘජු කෝණය
   ii. සෘජු කෝණය > පරාවර්ත කෝණය > සරල කෝණය > මහා කෝණය
   iii. සුළු කෝණය < සෘජු කෝණය < සරල කෝණය < මහා කෝණය
   iv. සෘජුකෝණය < මහා කෝණය < සරල කෝණය < පරාවර්ත කෝණය

08. $\frac{2}{3}$ ට තුල්‍ය භාගයක් ලියන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

09. ශිෂ්‍යයෙකුගේ උස 137cm වේ. එම උස මීටර් වලින් ප්‍රකාශ කරන්න.

10. සමාන්තරාස්‍රයේ සහ ත්‍රිපිසියම අතර වෙනස්කමක් ලියා දක්වන්න

11. 0.43 භාගයක් ලෙස ලියන්න.

12. අනුයාත ප්‍රථමක සංඛ්‍යා 2ක් ලියන්න.

13. සවිධි චතුස්ථලයේ දාර සහ ශීර්ෂ ගණන ලියන්න.

14. යම්කිසි සංඛ්‍යාවක් සියළු සංඛ්‍යාවල සාධකයක් වේ. එම සංඛ්‍යාව කුමක් ද?

15. 803 x 100 අගය සොයන්න.

16. බටහිර දිශාවට මුහුණලා සිටින ශිෂ්‍යයෙකුගේ වම් අත තිබෙන දිශාව කුමක් ද?

17. පහත දී ඇති ස්ථානවල සිරස් හෝ තිරස් බව ලියා දක්වන්න.
   - ටැංකියක ඇති ජලයේ මතු පිට
   - නිවසක බිත්තියක්

18. සාදයක් ප.ව. 5.30 ට ආරම්භ වී ප.ව. 8.15 ට නිමා විය. සාදය පැවැත්වූ කාලය කොපමණ ද?

19. සෘජු කෝණ දෙකක විශාලත්වයට සමාන කෝණය කුමක් ද?

20. එක, ත්‍රිකෝණ සංඛ්‍යාවක් මෙන්ම සමචතුරස්‍ර සංඛ්‍යාවක්ද වේ. 50ට අඩු අඩු ත්‍රිකෝණ සංඛ්‍යාවක් මෙන්ම සමචතුරස්‍ර සංඛ්‍යාවක්ද වන වෙනත් සංඛ්‍යාවක් ලියන්න.

## II කොටස

පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

(1) (a) ඔබ පංති කාමරය තුළ දී දශම සංඛ්‍යා පාඩම ඉගෙනගත් අවස්ථාව සිහිපත් කරගන්න.

i. $\frac{3}{100}$ දශම සංඛ්‍යාවක් ලෙස ප්‍රකාශ කරන්න. (ල.01)

ii. එම සංඛ්‍යාව කියවන ආකාරය අකුරින් ලියා දක්වන්න (ල.01)

iii. 4.53 යන සංඛ්‍යාවේ 3 ඉලක්කමෙන් නිරූපණය වන අගය කුමක් ද? (ල.01)

iv. 4.53 හා 4.35 යන සංඛ්‍යා දෙකෙන් විශාලතම සංඛ්‍යාව කුමක් ද? (ල.02)

v. අගය සොයන්න.

1)
$$\begin{array}{r} 2.65 \\ +\ 1.45 \\ \hline \\ \hline \end{array}$$

2) 2.6 - 1.23

To download past papers visit
www.vajirapani.blogspot.com

(ලකුණු 2x2=4)

(b) හිස් තැනට සුදුසු අගයක් ලියන්න.

i. 2.35 m = ............ cm

ii. 3043 m = ............ km ............m

iii. 3cm 4 mm = ............ mm

(ලකුණු 4)

(c) සෘජුකෝණාස්‍රාකාර ක්‍රීඩා පිටියක පරිමිතිය 420m වේ. ක්‍රීඩාපිටියේ දිග 120 m වන අතර එහි පළල සොයන්න. (ලකුණු 4)

(2) i. සුළු කරන්න. $\frac{5}{12} + \frac{1}{3}$ (ලකුණු 4)

ii. සුළු කරන්න. $\frac{4}{7} - \frac{1}{2}$ (ලකුණු 4)

iii. සුදුසු සංකේත යොදා පහත භාග සංසන්දනය කරන්න.

1. $\frac{1}{5}$ .......... $\frac{1}{7}$   2. $\frac{3}{4}$ .......... $\frac{3}{7}$   (ලකුණු 1x2=2)

(b) පහත දැක්වෙන සංඛ්‍යා රේඛාවෙන් සිසුන් හතර දෙනෙකුගෙ වයස් දැක්වේ.




To download past papers visit
www.vajirapani.blogspot.com

i. රනිල්ගේ වයස සොයන්න   (ලකුණු 01)

ii. විමල්, කමල්ට වඩා කොපමණ ප්‍රමාණයකින් වැඩිමල් ද?   (ලකුණු 01)

iii. .................. වයස < කමල්ගේ වයස හිස්තැන පුරවන්න.   (ලකුණු 01)

iv. විමල්ගේ උපන් වර්ෂය 2000 නම් බිමල් ගේ උපන් වර්ෂය සොයන්න. (ලකුණු 01)

(4) i. ඔබ විසින් පංති කාමරයේදී සාදන ලද ඝනවස්තු 2ක් නම් කරන්න.   (ලකුණු 03) 2

ii. ඒ අතරින් එක් ඝන වස්තුවක පතුරම ඇඳ පෙන්වන්න.   (ලකුණු 03)

iii. එම ඝන වස්තුවේ මුහුණ, ශීර්ෂ හා දාර ගණන් ලියා දක්වන්න.   (ලකුණු 03)

iv. සවිධි චතුස්තලයක මුහුණත හැඩය කුමක් ද?   (ලකුණු 01)

v. ත්‍රිපිසියමක් ඇඳ එහි ලක්ෂණයක් ලියා දක්වන්න.   (ලකුණු 02)

(5) (a) i. මිලිලීටර් වලින් ලියන්න.

a. 3l   b. 3l 65ml   (ලකුණු 1x2=2)

A හා B භාජන දෙකෙහි ඇති දියර ප්‍රමාණ පහත දක්වා ඇත. A භාජනයේ ඇති දියර ප්‍රමාණයෙන් හරි අඩක් B භාජනයට දමන ලදී.




i. B භාජනයේ නව දියර ප්‍රමාණය කොපමණ ද? 1

ii. A භාජනයේ ඉතිරි දියර ප්‍රමාණය කොපමණ ද? 2

iv. A භාජනයේ ඉතිරි වූ ප්‍රමාණය 1l බවට පත් කිරීම සඳහා තව කොපමණ දියර ප්‍රමාණයක් එක් කළ යුතු ද?   (ලකුණු 02)

b. සුළු කරන්න.

1.

| l | ml |
|---|---|
| 2 | 270 |
| + 3 | 430 |
| | |

(ලකුණු 01) 2

2

| l | ml |
|---|---|
| 2 | 100 |
| - 1 | 500 |
| | |

(ලකුණු 01) 2

(5)

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| 6 | 7 | 8 | 9 | 10 |
| 11 | 12 | 13 | 14 | 15 |
| 16 | 17 | 18 | 19 | 20 |
| 21 | 22 | 23 | 24 | |

මෙහි දක්වා ඇති සංඛ්‍යා අධ්‍යනය කර පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. විශාලතම ඔත්තේ සංඛ්‍යාව ලියන්න. (ල.1)

ii. සමචතුරස්‍ර සංඛ්‍යා තෝරා ලියන්න. (ල.2)

iii. ප්‍රථමක සංඛ්‍යා තෝරා ලියන්න. (ල.2)

iv. විශාලතම සංයුක්ත සංඛ්‍යාව ලියන්න. එහි සාධක සියල්ල ලියන්න (ල.3)

v. ඉහත සංඛ්‍යා අතරින් ත්‍රිකෝණ සංඛ්‍යා වන ඔත්තේ සංඛ්‍යා 2ක් ලියන්න. (ල.2)

vi. ඉහත සංඛ්‍යා අතරින් 2,5,10 යන සංඛ්‍යා 3න්ම ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාවක් ලියන්න. (ල.1)

(6) (a) ක්‍රීඩා සංදර්ශනයක සහභාගීවන ජගත් උතුරු දිශාවට මුහුණලා සිටින ඔහු තම දකුණු අත පැත්තෙන් ගිණිකොණ දිශාවට හැරේ.

To download past papers visit
www.vajirapani.blogspot.com

i. ජගත් කැරකුණු කෝණය ඇඳ පෙන්වන්න. (ල.1)

ii. එම කෝණය කුමන වර්ගයේ කෝණයක්ද? (ල.2)

iii. ඔහු කැරකුණු පසු, ඔහු සිටින දිශාවට ප්‍රතිවිරුද්ධ දිශාව කුමක් ද? (ල.2)

(b) සාරි, ශීතකරණ, කිරිබත්, ගවුම, ඉඳිආප්ප, රූපවාහිනිය, කලිසම, කමීසය, පාන්, විදුලි උඳුන

i. ඉහත ද්‍රව්‍ය පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩ3 ට වෙන් කර දක්වන්න.



P Q R

(ල. 3)

ii. එම පොදු ලක්ෂණය අනුව එක් එක් කාණ්ඩය සඳහා නම් ලියන්න.

P = ............................ Q = .......................... R = ..............................

(ල.3)

(7) (a)

i. ගුණ කරන්න. 254 x 23 (ල.3)

ii. බෙදන්න. 1024 ÷ 8 (ල.2)

(b) පහත ප්‍රකාශන සත්‍ය නම් (✓)ලකුණද අසත්‍ය නම් (X) ලකුණද යොදන්න.

i. වෘත්තයට සමමිතික රේඛා 6ක් පමණක් ඇත.

ii. ඕනෑම ඉරට්ටේ සංඛ්‍යා 2ක් ගුණ කළවිට පිළිතුර ඉරට්ටේ වේ.

iii. සියළුම සමචතුරස්‍ර සංඛ්‍යා සංයුක්ත සංඛ්‍යා වේ (ල.3)

(c) ක්‍රිකට් ක්‍රීඩා තරඟයක් පෙ.ව. 11.15 ට ආරම්භ වූ අතර පැය 4 මිනි. 20 ක කාලයක් පුරාවට පැවැත්විනි.

i. තරඟය ආරම්භ වූ වේලාව සම්මත ආකාරයෙන් ලියන්න. (ල.1)

ii. තරඟය අවසන් වූ වේලාව සම්මත ආකාරයෙන් ලියන්න. (ල.2)